කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

(නව / පැරණි නිර්දේශය)

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON- E 1015

ආර්ථික විද්‍යාවේ මූලධර්ම

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. අ) ආර්ථිකවිද්‍යා විෂයේ ආරම්භය සහ විකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

ආ) ''හිඟකම'' සහ "සම්පත් වෙන්කරලීම" අතර පවත්නා සම්බන්ධතාව නිදසුන් ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 08)

02. අ) නිෂ්පාදන හැකියා පර්යන්තයක් මගින් අදහස් වන්නේ කුමක්දැයි පහදා නිෂ්පාදන හැකියා පර්යන්තයක් කුමන උපකල්පනවලට යටත්ව ගොඩනගන්නේද යන්න විස්තර කරන්න. (ලකුණු 06)

ආ) යථානුරූපී ආර්ථිකවිද්‍යාව සහ අභිමතානුරූපී ආර්ථිකවිද්‍යාව අතර වෙනස දක්වන්න. (ලකුණු 06)

ඉ) අර්ථ ක්‍රමයක මූලික ආර්ථික ඉලක්ක මොනවාදැයි විස්තර කොට වෙළඳ පොල අර්ථ ක්‍රමයක් එම ඉලක්ක වෙත ළඟාවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. අ) පෞද්ගලික භාණ්ඩ සහ පොදු භාණ්ඩ පිළිබඳ පාරිභෝජන සමතුලිත මූලධර්ම අතර පවත්නා වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 08)

ආ) ආන්තික උපයෝගීතා සංකල්පය සහ ඉල්ලුම් වක්‍රය අතර පවත්නා සම්බන්ධතාව පෙන්වන්න. (ලකුණු 06)

ඉ) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය 'වහන්තරා වක්‍රය' (Envelop curve) ලෙස හඳුන්වන්නේ මන්දැයි පහදන්න. (ලකුණු 06)

04. අ) වෙළඳපොලට පහත දැක්වෙන රජය මැදිහත්වීම් වල ප්‍රතිවිපාක යෝග්‍ය රූප සටහන් ආධාරයෙන් පහදන්න.

1. භාණ්ඩයක් මත ආනයන බද්දක් පැනවීම (ලකුණු 03)
11. සලාක ක්‍රමයක් හඳුන්වාදීම (ලකුණු 03)
111. උපරිම පාලන මිලක් නියම කිරීම (ලකුණු 03)

ආ) 'x' නම් භාණ්ඩයට අදාළ ඉල්ලුම් සහ සැපයුම් ශ්‍රිත පහත දක්වා ඇත.

$Q_d = 3000 - 2Px + 3P_Y - 0.2Y$ සහ $Q_s = -200 + 3Px$

1. $P_y = 20$ සහ $Y= 6000$ වන විට 'x' නම් භාණ්ඩයේ වෙළඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04)
11. $P_y = 25$ සහ $Y= 8000$ දක්වා ඉහළ යන්නේ නම් නව වෙළඳ පොළ සමතුලිතය ගණනය කරන්න (ලකුණු 03)
111. හරස් ඉල්ලුම් නම්‍යතාව සහ ආදායම් ඉල්ලුම් නම්‍යතාව සොයන්න. (ලකුණු 04)

05. අ) නිෂ්පාදන න්‍යායේ කෙටිකාලීන සහ දිගුකාලීන විශ්ලේෂණ අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් මොනවාද? (ලකුණු 08)

ආ) 'අයභාර වක්‍ර ' සහ 'පිරිවැය වක්‍ර' අතර පවත්නා සම්බන්ධතාව යෝග්‍ය රූප සටහනක් භාවිතයෙන් පෙන්වන්න. (ලකුණු 06)

ඉ) ඒකාධිකාරී වෙළඳපොල මාදිලිය ආර්ථික අකාර්යක්ෂමතාවකට හේතුවන බවට ආර්ථික විද්‍යාඥයින් තර්ක කරනුයේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. අ) ඒකාධිකාරී සහ කතිපයාධිකාරී වෙළඳපොල මාදිළි අතර පවත්නා සමානතා සහ අසමානතා මොනවාද ? (ලකුණු 10)

ආ) ඒකාධිකාරී තරඟ වෙළෙඳපොල මාදිළිය පූර්ණ තරඟය සහ ඒකාධිකාරී වෙළඳපොල මාදිලි වලින් කෙසේවෙනස් වන්නේද? (ලකුණු 10)

07. අ) විවෘත ආර්ථිකයක සමතුලිත ජාතික ආදායම නිර්ණය වන ආකාරය යෝග්‍ය ප්‍රස්ථාර සටහනක් මගින් පෙන්වන්න. (ලකුණු 10)

ආ) විවෘත ආර්ථිකයක ආනයන සහ අපනයන ජාතික ආදායමට කෙසේ බලපාන්නේද? (ලකුණු 06)

ආ) ගුණකය යනු කුමක්ද? ගුණකය කෙසේ ක්‍රියා කරන්නේ ද? යන්න විස්තර කරන්න. (ලකුණු 06)

08. අ) මුදලට ඇති ඉල්ලුමෙහි සංරචක සහ ඒවායේ අදාළත්වය විස්තර කරන්න. (ලකුණු 08)

ආ) අර්ථ ක්‍රමයක මහ බැංකුවේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඉ) විවට වෙළඳ කටයුතු වශයෙන් ඔබ අදහස් කරන්නේ මොනවාදැයි පහදන්න (ලකුණු 06)

******************************